# මාධ්‍ය නිවේදනය

**විදේශ අමාත්‍ය මංගල සමරවීර මැතිතුමා ශ්‍රී ලංකා - ඕස්ට්‍රේලියා ද්විපාර්ශ්වික හවුල්කාරීත්වය ශක්තිමත්කිරීමට හා තකහවුරු කිරීමට ඇති ඇප කැප වීම අවධාරණය කරයි.**

විදේශ අමාත්‍ය මංගල සමරවීර මැතිතුමා අප්‍රේල් 06 වන දින සිඩ්නිහිදී ඕස්ට්‍රේලියාවේ විදේශ ඇමතිනී ජූලි බිෂොප් මැතිණිය හමුවූ අවස්ථාවෙහි අන්‍යෝන්‍ය ප්‍රතිලාභ උදෙසා ඕස්ට්‍රේලියාව සමග භුක්ති විදින දිගු කාලීන සබදතා තව දුරටත් ශක්තිමත් කිරීම සදහා ශ්‍රී ලංකාවේ ඇති කැපවීම අවධාරණය කරයි.ඕස්ට්‍රේලියානු රජය අමුත්තෙකු වශයෙන් සමරවීර අමාත්‍යතුමා අප්‍රේල් 04 - 06 දින වලදී ඕස්ට්‍රේලියාවේ නිල සංචාරයක නියැලිණි. 2015 පැවති පාර්ලිමේන්තු මැතිවරණයේදී නව රජය බලයට පත්වීමෙන් පසුව ශ්‍රී ලංකා කැබිනට් අමාත්‍යවරයෙකු ඕස්ට්‍රේලියාවේ නියැලුනු පළමු සංචාරය මෙය වේ. ප්‍රජාතන්ත්‍රවාදය යළි ස්ථාපිත කිරීම, සංහිදියාව ඇති කිරීම හා සාමයේ ප්‍රතිලාභ සියලුම ශ්‍රී ලාංකිකයන්ට ලැබෙන ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම ශ්‍රී ලංකා රජය ප්‍රමුඛත්වයෙහි ලා සළකන බව දේශපාලන හා ආර්ථික සබදතා වලට අදාළ සියලුම ක්ෂේත්‍ර ආවරණය කරමින් පැවති සාකච්ඡා වලදී අමාත්‍ය සමරවීර මැතිතුමා අවධාරණය කළේය.

ඕස්ට්‍රේලියානු විදේශ ඇමතිනී ජූලි බිෂොප් මැතිණිය අතින් දියත් කරන්නට යෙදුනු ආසියානු ක්‍රීඩා හවුල්කාරීත්ව වැඩසටහනට අමාත්‍ය මංගල සමරවීර මැතිතුමන්ද එක්විය. ශ්‍රී ලංකාවේ දැල් පන්දු ක්‍රීඩාවේ උන්නතිය සදහා ආධාර ලබා දීමද මෙම වැඩසටහන මගින් සිදුවේ. වඩාත් පරිපූර්ණ සමාජයක් ගොඩනැංවීමේ ක්‍රියාවලියේදී ක්‍රීඩාව වැදගත් කාර්ය භාරයක් ඉටු කරන බව අමාත්‍ය ජූලි බිෂොප් මැතිණිය විසින් පෙන්වා දෙන ලදී. මෙම උත්සවය අතරතුර අමාත්‍ය සමරවීර මහතා සභාව අමතමින් ශ්‍රී ලංකා දැල් පන්දු ක්‍රීඩාවට ලබා දෙන ආධාර උපකාර පිළිබද ඕස්ට්‍රේලියානු රජයට සිය ස්තූතිය පළ කරන අතර එමගින් විශේෂයෙන් මෙම ක්‍රීඩාවේ යෙදෙන ගම්බද ප්‍රදේශ වල සිටින කාන්තාවන් වෙත සාමාජීය වශයෙන් බල ගැන්වීමක් ලැබෙන බවත් නීරෝගී ජීවන රටාවකට මග විවරවන බවත් පෙන්වා දුන්නේය. ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ක්ෂේත්‍රයේ සංවර්ධනය උදෙසා ඕස්ට්‍රේලියානු රජය ලබා දෙන දායකත්වය අද ඊයේ සිදුවූවක් නොවන බව සිහිපත් කළ අමාත්‍යවරයා 1981 ශ්‍රී ලංකා ජාතික ක්‍රිකට් කණ්ඩායම ටෙස් වරම් ලබා ගැනීමෙන් අනතුරුව විදේශීය සංචාරයක් සදහා ආරාධනා කළ පළමු රට ඕස්ට්‍රේලියාව බවද ස්තූතිපූර්වකව සිහිපත් කළේය. ඕස්ට්‍රේලියාව දිගු කාලයක සිට ශ්‍රී ලංකාවේ මිතුරෙකුව කටයුතු කරන බව සදහන් කළ අමාත්‍යතුමා දෙරට අතර පැවති රාජ්‍ය තාන්ත්‍රික සබදතා වල 70 වන සංවත්සරය 2017 වසරේදී උදා වන බව ප්‍රකාශ කළේය. කෙසේ වෙතත් දෙරටේ ද්වී පාර්ශ්වික සබදතා කේන්ද්‍රගත වූයේ පසුගිය වසරවල සිදුවුනු අනවසර මිනිස් ජාවාරම සම්බන්ධයෙන් වන අපගේ සහයෝගීතාව වෙතය. නව රජය බලයට පත්වීමත් සමග එසේ ඕස්ටේලියාවට යන අනවසර සංචාරකයින්ගේ සංඛ්‍යාවේ කැපී පෙනෙන අඩුවීමක් දක්නට ලැබෙන බව අමාත්‍ය සමරවීර මහතා විසින් පෙන්වා දෙන ලදී. එසේ වුවත් මුදල් ඉපැයීමේ පරමාර්ථයෙන් විදේශ ගත වන අහිංසක ශ්‍රී ලාංකිකයින් ගොදුරු කර ගන්නා අනවසර මිනිස් ජාවාරමෙහි යෙදෙන්නන්ට එරෙහිව ඕස්ට්‍රේලියානු රජය ගෙන යන වැඩපිළිවෙළට නිරතුරු තම සහය ලබා දෙන බව එතුමා ප්‍රකාශ කර සිටියේය. ප්‍රජාතන්ත්‍රීකරණය, සංහිදියාව සහ සංවර්ධනය තුළින් සාමය හා සමෘද්ධිය ලගා කර ගැනීමේ මං පෙතට ශ්‍රී ලංකාව දැන් ප්‍රවිශ්ඨ වී සිටින බවත් විශේෂයෙන්ම ආර්ථික හා වෙළද ක්ෂේත්‍රයන්ට අදාළව අපගේ ද්විපාර්ශ්වික සබඳතා තව දුරටත් පුලුල් කර ගත යුතු බවත් එතුමා පෙන්වා දුන්නේය. ශ්‍රී ලංකාව සමග පවත්වාගෙන යන ද්විපාර්ශ්වික සබදතාවල තත්වය සම්බන්ධයෙන් සතුට පළ කළ විදේශ කටයුතු අමාත්‍ය ජූලි බිෂොප් මැතිණිය දෙරට ජනතාව අතර ඇති විශිෂ්ඨ මිත්‍රත්වය පිළිබදවද සදහන් කළාය. නීති විරෝධි ලෙස මිනිසුන් ප්‍රවාහණය කිරීම මැඩපැවැත්වීමෙහිලා ශ්‍රී ලංකාව ලබා දෙන සහයෝගය සම්බන්ධයෙන්ද ඇය ශ්‍රී ලංකාවට ස්තූතිය පළ කළාය.

විදේශ කටයුතු අමාත්‍යතුමාගේ ඕස්ට්‍රේලියා සංචාරය අතරතුරදී එතුමා ඕස්ට්‍රේලියාවේ වෙළද හා ආයෝජන අමාත්‍ය ස්ටීවන් සියෝබෝ මැතිතුමා හා ආගමන හා දේශසීමා ආරක්ෂාව පිළිබද අමාත්‍ය පීටර් ඩුටෝන් මැතිතුමාද හමුවූ අතර ඔහුත් සමග ද්විපාර්ශ්වික ගැටලු පිළිබදව සාකච්ඡා කළේය. වික්ටෝරියාවේ පිහිටි ඕස්ට්‍රේලියානු ජාත්‍යන්තර කටයුතු ආයතනය සහ සිඩ්නි නුවර පිහිටි ආසියානු සංගමය විසින් නැව්මාස් සංගමයේද සම අනුග්‍රහය සහිතව සූදානම් කරන ලද දිවා භෝජන සංග්‍රහයකටද අමාත්‍යතුමාට ආරාධනා ලැබුණු අතර එහිදී එතුමා නව ශ්‍රී ලංකාවක දිශානතිය සම්බන්ධයෙන් සිය අදහස් ප්‍රකාශ කළේය.

ශ්‍රී ලංකා මහකොමසාරිස් සෝමසුන්දරම් ස්කන්ධකුමාර් මහතා, මෙල්බන් හා සිඩ්නි නුවර කොන්සාල්ජනරාල්වරුන් වන ප්‍රසන්න ගමගේ හා ලාල් වික්‍රමතුංග යන මහත්වරු හා විදේශ කටයුතු අමාත්‍යාංශයේ නිලධාරීන්ද විදේශ අමාත්‍යතුමා සමග මෙම සංචාරයට එක්වූහ.

2016 අප්‍රේල් 06
ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය
කැන්බරා